72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 ජූලි 28
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව 1:00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# 2023 ජූනි මාසයේදී අපේක්ෂිත ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රායේ සුළු වෙනසක්: AKD 40%, සජිත් 35%, රනිල් 15%


## *2023 ජූනි IHP/SLOTS ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම*

ජූනි මස IHP/SLOTS MRP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය මත විමසුම පෙන්නුම් කරන්නේ 35%ක් ලබා සිටින ස.ජ.බ. නායක සජිත් ප්‍රේමදාසට (මැයි මසට සාපේක්ෂව ලකුණු 2 ක් අඩුවේ) වඩා ජා.ජ.බ./ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායකට 40% ක ඡන්දදායකයින්ගේ සහායක් (මැයි මසට සාපේක්ෂව සැලකිය යුතු වෙනසක් නොමැත) ඇති බවයි. මොවුන් දෙදෙනාම 15%ක සහයක් ලැබූ ජනාධිපති රනිල් වික්‍රමසිංහට (වෙනසක් නැත) සහ 9% ක් ලැබූ පොදු ශ්‍රී.ල.පො.පෙ. අපේක්ෂකයාට (+2) වඩා ඉදිරියෙන් සිටියි.



2023 ජූනි මාසය තුළ පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 506ක් සහ 2021 ඔක්තෝම්බර් 01 දින සිට 2023 ජූලි 20 වෙනි දින දක්වා පවත්වන ලද මුළු සම්මුඛ සමීක්ෂණ 11,926 ක් මත 2023 ජූනි MRP ඇස්තමේන්තු පදනම් වේ. විවිධ අපේක්ෂකයින් සඳහා ඇස්තමේන්තු 1-3% දෝෂ ආන්තිකයක් සහිතව ගණනය කර ඇත.

ජූනි මත විමසීමට අනුව, පසුගිය මාස 4ක කාලය තුළ එක් එක් අපේක්ෂකයා සඳහා ආසන්නව සමාන ප්‍රතිශත අගයන් ලැබීමෙන් ගම්‍ය වන්නේ 2023 වර්ෂය ආරම්භයේ සිට ඡන්දදායකයින්ගේ මනාපයන් ස්ථාවර වී ඇති බවයි. පසුගිය මාසවල සැලකිය යුතු වර්ධනයක් පෙන්වනු ලැබූ ජනාධිපති රනිල් වික්‍රමසිංහට ද ජූනි මාසයේ දී කිසිදු වැඩි වීමක් නොපෙන්වා ඇති අතර පොදු ශ්‍රී.ල.පො.පෙ අපේක්ෂකයා, අනෙකුත් අපේක්ෂකයන්ට සාපේක්ෂව පහළින් සිටියද මන්දගාමී ලෙස වැඩි වීමක් පෙන්නුම් කරයි.




SLOTS මත විමසුම් සමීක්ෂණයේ අධ්‍යක්ෂ වෛද්‍ය රවී රන්නන්-එලිය මහතා සඳහන් කරනු ලැබුවේ, SLOTS මහ මැතිවරණ මත විමසුමට අනුව අනුර කුමාර දිසානායක ඔහුගේ පක්ෂය ලැබූ අපේක්ෂිත සහයට වඩා ලකුණු 17 ක් ඉදිරියෙන් සිටින බවත්, සජිත් ප්‍රේමදාස ඔහුගේ පක්ෂය වන ස.ජ.බ. හා සසඳන විට ලකුණු 12 ක් පමණක් ඉදිරියෙන් සිටින බවත්ය. මහ මැතිවරණයකදී සජිත් ප්‍රේමදාස මහතාට ITAK සහ අනෙකුත් සුළු පක්ෂයන්හි ඡන්දදායකයන්ගෙන් අසමානුපාතික ප්‍රතිශතයක් ලැබෙන බැවින්, සිංහල ඡන්ද කොට්ඨාශවල ස.ජ.බ. නොවන ඡන්දදායකයින් ආකර්ෂණය කර ගැනීමේදී ප්‍රේමදාස මහතාට මෙය අඛණ්ඩව පවතින අභියෝගයක් වනු ඇති බව ඔහු සඳහන් කළේය.

**පෙර වාර්තා ihp.lk යෙන් ලබා ගත හැකිය**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මාර්තු, "2023 පෙබරවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: ජා.ජ.බ./ජ.වි.පෙ., ස.ජ.බ. සහ දෙ.ජා.ස. වටා වැඩි ඡන්දදායකයින් ප්‍රමාණයක් ඒකරාශී වී ඇති අතරම එයින් ජා.ජ.බ./ජ.වි.පෙ. පැහැදිලි ලෙසම පෙරමුණ ගනී", SLOTS වාර්තාව #2023-06 [https://www.ihp.lk/publications/docs/SLOTSReport202306.pdf](https://www.ihp.lk/publications/docs/SLOTSReport202306.pdf) යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අප්‍රේල්, "2023 මාර්තු IHP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම: අනාගත ජනාධිපතිවරණයකදී අනුර කුමාර දිසානායක (48%) සජිත් ප්‍රේමදාස (37%) අභිබවමින් පෙරමුණ ගනියි". [https://www.ihp.lk/publications/docs/SLOTSReport202309.pdf](https://www.ihp.lk/publications/docs/SLOTSReport202309.pdf) යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මැයි, "2023 අප්‍රේල් IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: අනුර කුමාර දිසානායකට ලැබෙන සහයෝගය 45% දක්වා පහත වැටුණත් ඔහු තවමත් සජිත් ප්‍රේමදාස (37%) ට වඩා පෙරමුණෙන් සිටියි", IHP මාධ්‍ය ප්‍රකාශය #2023-16. https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230526.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූනි, "මැයි මසදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ සහ ශ්‍රී.ල.පො.පෙ. ට ඇති සහයෝගයේ වර්ධනයක්. 2023 මැයි IHP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම", IHP මාධ්‍ය ප්‍රකාශය #2023-19.
https://ihp.lk/news/pres_doc/IHPPressRelease202306302.pdf යෙන් ලබා ගත හැකිය.

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 ජූනි MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 506ක් සහ 2021 ඔක්තෝබර් 1 සිට 2023 ජූලි 20 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 11,926ක් මත පදනම් වන අතර එක් එක් අපේක්ෂකයා සඳහා 1-3%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත. මීට පෙර සිදුකල යාවත්කාලීන කිරීමට වඩා ජූනි යාවත්කාලීන කිරීමේදී නවතම දත්ත කට්ටලය භාවිතා කරන බැවින්, පෙර මාස සඳහා ඡන්ද ඇස්තමේන්තු අගයන්හි සුළු වෙනස්කම් සිදු ව ඇත. ප්‍රතිචාර දක්වන ලද සම්මුඛ සාකච්ඡා වල නියැදියේ වෙනස්වීම් සහ ආකෘති නිර්මාණයේ අවිනිශ්චිතතාවයන් හේතුවෙන් ඇති වන ඇස්තමේන්තු ආශ්‍රිත අවිනිශ්චිතතාවය තක්සේරු කිරීම සඳහා ආකෘති නිර්මාණයේදී stochastic simulations 60ක් භාවිතා කරන ලදී.

MRP යනු විශ්ලේෂණයට කුඩා සාම්පල භාවිත කිරීම සඳහා වෙනත් රටවල ඡන්ද ආයතන විසින් සුලබව භාවිත කරනු ලබන ක්‍රමයකි, විශේෂයෙන් YouGov විසින් එක්සත් රාජධානියේ බ්‍රෙක්සිට් ජනමත විචාරණයේ සහ මෑත කාලීන එක්සත් රාජධානියේ මහ මැතිවරණයේ ප්‍රතිඵල පුරෝකථනය කිරීමට මෙම ක්‍රමය භාවිතා කළේය. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.